# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2072/25 - 2018 මැයි මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2018.05.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ (2) වගන්තිය යටතේ නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66ආ (2) වන වගන්තිය යටතේ තනතුර දැරූ උප සභාපති වන කාලිමුත්තු සිවසාමි අයත් වන්නා වූ ලංකා කම්කරු කොංග්‍රසය (දේශපාලන අංශය) නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ උප සභාපති පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා තංගරාජ් කිසෝකුමාර් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද ;

නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී පුලස්ති පතිරණ වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සංශෝධන පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය වූ) 66ආ (2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් තංගරාජ් කිසෝකුමාර්, නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පුලස්ති පතිරණ,
තේරීම්භාර නිලධාරී,
නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව.

2018 මැයි මස 23 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
නුවරඑළිය.

06 - 443


1A - G 27731 — 17 (2018/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*